WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

සිංහල භාෂාව හා සාහිත්‍යය I, II
சிங்களமொழியும் இலக்கியமும் I, II
Sinhala Language and Literature I, II

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

※ ප්‍රශ්න **සියල්ලට ම** උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
(අ) පතල (ආ) පතළ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
"කසල කළමනාකරණය පිළිබඳ පවතින ගැටලු නිරාකරනය කිරීම කාලීන අවශ්‍යතාවක් බව පරිසරවේදීහු පෙන්වා දෙති."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
(අ) උදර + ආබාධ (ආ) ඉන් + ඉක්බිති

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.
"පරිසර සංරක්ෂණය පිළිබඳව උපසභාපතිතුමා පැවැත්වූ කතාවට සියල්ලෝ ම කොන්දේසි විරහිතව එකඟතාව දැක්වූහ."

(v) පහත සඳහන් පද්‍ය පාඨයේ **තද කළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
"අසන **රිසින්** නයි කැල **ඔසළෝ යා**"

(vi) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) බස්නාහිර සහ උතුර අතර ඇති අනුදිශාව
(ආ) දුරදිග බලා ක්‍රියා කරන

(vii) පහත දැක්වෙන යෙදුම් සඳහා හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
(අ) පාවහන් (ආ) අලියා

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්, ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරති.
(ආ) ක්‍රීඩකයෝ තරගය දිනති'යි පුහුණුකරුවෝ සිතූහ.

(ix) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තද කළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) රියදුරා මාර්ග නීති **කඩකරමින්** රිය පැදවූයේ ය.
(ආ) සියලු දෙනා ම විභාගයෙන් **සමත් වෙත්වා**'යි කියමින් ගුරුතුමිය සමුගත්තා ය.

(x) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
(අ) විශේෂ දෙසුම (ආ) කර්තෘ වැකි (ලකුණු 2 × 10 = 20 යි)

WWW.OLEVELAPI.COM

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) මේ වන විට ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින විශාල ප්‍රමාණයේ ඉඩම් කැබලි කර විකිණීම මගින් ප්‍රබල සමාජ ප්‍රශ්න කිහිපයක් උද්ගත වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝගයක් වන පොල් වගාව විනාශ මුඛයට පත්වීම ඉන් එකකි. ළිඳක්, වැසිකිළියක් සහ විධිමත් පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයක් වැනි අත්‍යවශ්‍ය මූලික අංගෝපාංග පවා ඉදිකර ගැනීමට ප්‍රමාණවත් නොවන සුළු ඉඩකඩක් සහිත මේ බිම්කට්ටිවල ජීවත් වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් එල්ලවීම තවත් ප්‍රශ්නයකි.

(ආ) වසවිසෙන් තොර කෘෂිකර්මාන්තයක් මෙරට ස්ථාපනය කිරීම පිළිබඳව මේ දිනවල විවිධ යෝජනා ඉදිරිපත් වෙමින් පවතී. රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය දැනටමත් ක්‍රියාත්මක ය. මෙම ක්‍රියාවලියට සමගාමීව රුක්රෝපණය වැනි ව්‍යාපෘති ද ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වන්නේ කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීම උදෙසා මෙන් ම පරිසර සංරක්ෂණය උදෙසා ද එමගින් පිටුබලයක් සැපයෙන බැවිනි.

(ඉ) ළමා මනසට ගෝචර වන චිත්‍රපට නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වෙමින් පවතී. එහෙත් ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට නොමැති තරම් ය. අර්ථවත් තේමා සහිත ළමා චිත්‍රපට ළමයින්ට විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් මෙන් ම විවිධ තොරතුරු සම්බන්ධයෙන් දැනුම ලබාදෙන මාධ්‍යයක් වශයෙන් ද භාවිත කිරීමේ හැකියාව පවතී.

[ හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ර) සමුද්‍රීය පරිසර දූෂණය හෙවත් වෙරළාසන්න පරිසර දූෂණය අතින් ශ්‍රී ලංකාව පස්වන ස්ථානයේ පවතින බව පසුගියදා පුවත්පත් වාර්තාවක පළ වී තිබිණි. මෙරටට විදේශ විනිමය උපයා ගැනෙන ප්‍රධාන ක්‍රමවේදයක් වන සංචාරක ව්‍යාපාරය කෙරෙහි මෙන් ම විශේෂයෙන් ම වෙරළාසන්න ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි ද ඍණාත්මක ව බලපාන සමුද්‍රීය පරිසර දූෂණය වළක්වා ගැනීමේ ක්‍රමෝපාය කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි. (ලකුණු 25 යි)

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 - 65** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අද පවතින වෙළෙඳ ව්‍යාපාරවල එකම අරමුණ වී ඇත්තේ අධික ලෙස මුදල් ඉපයීමයි. මේ සඳහා වෙළෙන්දන් හැකි සෑම උපක්‍රමයක් ම යොදන අතර ඔවුන්ගේ අදහස් ක්‍රියාවට නංවන වෙළෙඳ දැන්වීම්කරුවෝ ද එය ඒ අයුරෙන් ම ක්‍රියාවට නඟති. තරගකාරී තත්ත්වයට පත්ව ඇති මෙම වාණිජමය අරමුණු සේවා හා භාණ්ඩ මගින් ක්‍රියාත්මක වේ. පාරිභෝගිකයා දිනා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපක්‍රම රටේ සංස්කෘතියට, සභ්‍යත්වයට හා අනාගත පැවැත්මට කොතරම් හිතකර ද යන්න ගැන තැකීමක් නොකිරීම කනගාටුවට කරුණකි. මෙම වෙළෙඳ උපක්‍රමවලට සාමාන්‍ය ජනතාව පමණක් නොව දැන උගත් අය පවා රැවටෙන අවස්ථා අපමණ ය.

අද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා පමණක් නොව විවිධ රැස්වීම් මගින් ද තම භාණ්ඩ හෝ සේවාව සෑමට ම වඩා වාසිදායක හා ලාභ බව පැවසීමට එහි නිරතවන කිසිවෙක් පසුබට නොවෙති. ඇත්ත නැත්ත වටහා ගැනීමට බැරි තරමට ප්‍රයෝගකාරී දර්ශන පෙන්වනවා පමණක් නොව ඒ ගැන රසකරමින් කියන වාර ගණන ද අසීමිත ය. ඔවුන්ගේ වාණිජ පරමාර්ථය මේ ආකාරයෙන් ඉටු වුවත් ඉන් සමාජයට වන බරපතල හානි අපමණ ය. ව්‍යාපාරිකයා පිනවා විශාල මුදලක් ලබා ගැනීමට උත්සාහ දරන දැන්වීම්කරුවා ජනතාවගේ සිත ආකර්ෂණය කර ගැනීමට වෙළෙඳ භාණ්ඩයේ නැති ගුණ වනයි. මාධ්‍යය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙලඹෙති. (ලකුණු 10 යි)

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කරන ලද්දේ සියබස්ලකර විසිනි. කාව්‍යයේ ස්වරූපය හා වර්ණනා ක්‍රමය කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳ නීතිරීති මෙම ග්‍රන්ථය මගින් පනවන ලදි. මහාකාව්‍යය උසස් ම කාව්‍යය හැටියට සලකන ලදි. කව්සිළුමිණ වැනි ආදි ම පද්‍ය කාව්‍යයන් පටන්, ඉතා මෑත කාලයක ලියවුණු කාව්‍යයන් දක්වා, පැරණි සම්ප්‍රදායන් අනුව කවි ලියූ හැම කවියෙක් ම සියබස්ලකරින් නිශ්චිත, කවි සමය ගුරු කොට ගත්තේ ය. 'පෙදෙන් බුදු සිරිත් ඈ' යනාදි වශයෙන් පද්‍යයට වස්තු විය යුත්තේ බුද්ධ චරිතයක් බව සියබස්ලකරින් පැවසිණි. ඒ අනුව ගිය සිංහල කවීහු සිය කෘතීනට ජාතක කථා වස්තු කොට ගත්හ. කාව්‍යයේ අලංකාර ගැබ්විය යුතු යයි ද, ඍතු ආදි වර්ණනා ගැබ්විය යුතු යයි ද, යන අදහස සිංහලයේ පතුරුවන ලද්දේ සියබස්ලකර විසිනි.

සංස්කෘත කාව්‍ය ලක්ෂණ සිංහල කාව්‍යයට ඇතුළත්ව ඇති බවත්, සිංහල කවීන් සංස්කෘත පොත පත අනුගමනය කළ බවත්, පැරණි සිංහල සාහිත්‍යය පිරික්සන විචාරකයෝ පවසති. සිංහල කාව්‍යය අලංකාරවාදයේ ඵලයක් හැටියට හඳුන්වති. සකු කවියන් අනුව යෑමට සිංහල කවීනට අනුබල දුන්නේ සියබස්ලකරයි. සිංහල කවීහු හැම දෙන ම සියබස්ලකරින් උගන්වන ලද කවි සම්ප්‍රදාය තදින් වැලඳ ගත්හ. අනුරාධපුර යුගයේ දී සියබස්ලකර වැනි ග්‍රන්ථයක් රචනා කිරීමෙන් ම පෙනී යනුයේ ඒ අවධිය වන විට බෙහෙවින් දියුණු වූ සිංහල කාව්‍ය සාහිත්‍යයක් බිහිව තිබුණු බවයි.

(i) පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කෙරුණු සියබස්ලකරෙන් පනවන ලද්දේ කුමක් ද?
(ii) පැරණි සම්ප්‍රදායට අයත් හැම කවියෙක් ම ගුරු කොට ගත්තේ කවර දෙයක් ද?
(iii) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට සිංහල කවීහු සිය කෘතිවලට වස්තු විෂය කරගත්තේ මොනවා ද?
(iv) මෙහි සඳහන් වන ආදිම පද්‍ය කාව්‍යයක් වන ග්‍රන්ථයෙහි නම කුමක් ද?
(v) අනුරාධපුර යුගයේ දියුණු කාව්‍ය සම්ප්‍රදායක් පැවති බවට මෙම පාඨයේ ඇතුළත් සාක්ෂිය කුමක් ද?

(ලකුණු 10 යි)

**5.** මිරිහාන ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ දී සිදු කෙරුණු සාකච්ඡාවකින් කොටසක් පහත දැක්වේ. මින් අදාළ කරුණු පමණක් තෝරාගෙන වචන **100**කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රාදේශීය සභාවේ ලේකම් මහේන්ද්‍ර ජයලත් ඔබ යැයි සිතන්න.

- අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත එකතු වන අපද්‍රව්‍ය මගින් පරිසරයට විශාල හානියක් සිදු වෙනවා. වැහි කාලෙට වතුර බහින්නෙ නෑ. මදුරුවෝ බෝ වෙනවා. දුගඳ හමනවා.
- මිනිස්සු කිසිදු වග විභාගයක් නැතුව තමන්ගේ ගෙවල් අසල තියෙන හිස් ඉඩම්වලටයි පාරවල් අයින්වලටයි කුණු විසිකරන්න පුරුදු වෙලා.
- මේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩමුළුවක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕනෑ.
- මේ සඳහා දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය වෙන වෙන ම ඉවත් කිරීමට අදාළ භාජන අපි නොමිලයේ ලබා දෙන්න ඕනෑ.
- දිරාපත් වන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්න දිරිගන්වන්නත් පුළුවන්.
- අපි කොහොමද මේ ව්‍යාපෘතියට මිනිස්සු යොමු කරන්නේ?
- ඔව් එතෙනදි අපි මෙහෙම කරමු. කාබනික පොහොර නිෂ්පාදනය හා දිරාපත් නොවන ප්ලාස්ටික්, වීදුරු වැනි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ගැන ගම්මට්ටමින් වැඩමුළු පවත්වලා මිනිස්සු දැනුවත් කරමු.
- මේ විදියට නිපදවන කාබනික පොහොර ප්‍රාදේශීය සභාව මගින් මිල දී ගැනීමේ වැඩපිළිවෙළක් ආරම්භ කරමු. ඒ මගින් වැඩි ම ආදායම් උපයන පුද්ගලයන්ට තව-තවත් ඒ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා මුදල් ආධාර ලබා දෙමු. මේ විදියට විධිමත් පරිදි කාබනික පොහොර නිපදවන අය අතුරෙන් 1, 2, 3 ස්ථානවලට පිළිවෙළින් රුපියල් 40 000, 30 000 සහ 20 000 බැගින් ද තවත් දිරිගැන්වීම සඳහා සහතික පත්‍ර ද දෙන්න පුළුවන්.
- මේ ගැන ප්‍රදේශයේ ජනතාව හැකි ඉක්මනින් දැනුවත් කරන්න ඕනෑ.
- ඒ සඳහා ආකර්ෂණීය අත් පත්‍රිකාවක් පිළියෙල කර බෙදා හැරීමට ලේකම්තුමාට පවරමු.

**නැතහොත්**

කොළඹට ඉතා දුරින් පිහිටි 'ඇතා වැටුණු වැව' ග්‍රාමයේ පවුල් 250ක් පමණ ජීවත් වේ. පොදුවේ මේ පවුල්වල ජීවත්වන්නන්ගෙන් බොහොමයක් තම ජාතික හැඳුනුම්පත ලබාගෙන නොමැත. විවිධ වූ පෞද්ගලික හා සමාජීය කටයුතුවල දී අත්‍යවශ්‍ය වන හැඳුනුම්පත කොළඹට නොගොස් තම ග්‍රාමයේ දී ම ලබා ගැනීම සඳහා ජංගම සේවාවක් පැවැත්වීමට විධිවිධාන යොදන මෙන් ඉල්ලා සිටිමින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. ඇතා වැටුණු වැව ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ජයලත් මහින්ද ඔබ යැයි සිතන්න.
(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | III | පැය දෙකයි |
| சிங்களமொழியும் இலக்கியமும் | III | இரண்டு மணித்தியாலம் |
| Sinhala Language and Literature | III | Two hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.
※ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "අඟුල්මල් සොර 'රජ මා කරා එ' යනු දැනැ පළමු අවුදු දෙව්රම්හි හුන්නෙ යැ, රජු ගත,"
(අ) ඉහත සඳහන් පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.
(ආ) එම ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ii) රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට
(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් පද්‍ය පන්තියේ නම ලියන්න.
(ආ) එම කවි පෙළෙහි රචකයා නම් කරන්න.

(iii) (අ) 'අපට වැසිකිළියක්' කෙටි කතාව උපුටා ගත් කෙටි කතා සංග්‍රහය නම් කරන්න.
(ආ) 'අපට වැසිකිළියක්' කෙටි කතාවේ රචකයාගේ නම ලියන්න.

(iv) **වර** වෙණ නද අසමින් සිත සතොසිනි
**සර** හැර සියොතුන් පියපත් විදමිනි
පුර' ඔර වසමින් සිටි රඟ කුම වැනි
(අ) මෙහි ඉතිරි කවි පදය ලියන්න.
(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(v) "රාළහාමි, ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළ යි කියලා දැනගන්ඩ ලැබුණ ද?"
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

WWW.OLEVELAPI.COM

(vi) වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ
(අ) මෙම කවියේ 'සකිය' යන්නෙහි අර්ථය ලියන්න.
(ආ) මෙම කවිය කවර ජන කවි ගණයට අයත් ද?

(vii) (අ) ජාතක කතා මුල් කරගත් **ගී කාව්‍ය** ග්‍රන්ථ **දෙකක්** ලියන්න.
(ආ) උම්මග්ග ජාතකයෙහි සතර කන් මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතර ද?

(viii) දැතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි
(අ) ඉහත ගීත ඛණ්ඩය ඇතුළත් ගීතයේ රචකයාගේ නම ලියන්න.
(ආ) 'දහදිය මුතු ඇට' යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ix) (අ) 'දියමන්ති මාලය' කෙටි කතාවේ මුල් රචකයාගේ නම ලියන්න.

(ආ) නිර්දිෂ්ට 'දියමන්ති මාලය' කෙටි කතාව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(x) ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරුරා
අසන නිතියෙනා

(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් නිර්මාණය කුමක් ද?

(ආ) මෙහි 'ප්‍රේමවන්ත දරුවෙනි මා' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "කොල, වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඩ හස්වා පවුරු, දොරටු, අටලු, වාසල්, බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙන'වුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව; වේදේහ රජහු ඉසත් වහා ගෙනෙව" යි කීහ.

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) තත මතු ද සින්දේ
**පිළිමල්** දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය **සිරි සඳ** ගෙන වැලැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iii) 'සොර ක්ලාන්ත වි යැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි.'

(අ) පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරින
දුල කැරැ සේසත් මිණි බරණ කිරණින
බල පිරි සෙන් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) බබළවමින් සහ සූර්යයා යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන **දෙක** ලියන්න.

(ආ) යාපා පටුන ජයගෙන සපුමල් කුමරුන් පැමිණෙන ආකාරය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(v) කැර මිණි බරණ රැස්
රසින් **සුරසැවු** සුවහස්
සුරන් සහ **සහසැස්**
නො කැර සිටියේ අහස් කුස හිස්

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කවියේ අර්ථය ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

3. (i) උපයුක්ත භාෂා රීතිය සහ

(ii) යෝග්‍ය උපමා භාවිතය

උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) දාරක ස්නේහය සහ

(ii) ස්වාමි භක්තිය

අතර දෝලනය වන චරිතයක් වශයෙන් සුප්පා දේවියගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් සාකච්ඡා කරන්න. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් සපයන්න.

(ලකුණු 15 යි)

|තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....
WWW.OLEVELAPI.COM

4. (i) පවතින දේ ඇති සැටියෙන් වර්ණනා කිරීමට සහ
(ii) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීමට

සැළලිහිණි සන්දේශ කතුවරයා දක්වන සාමර්ථ්‍යය එක් කොටසකට උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

(i) ජන කවියේ ඇති අව්‍යාජභාවයත්
(ii) භාෂා භාවිතයේ සරලත්වයත්

කුරක්කන් කවිවලින් නිරූපණය වේ. එක් කරුණක් සඳහා උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

5. දේශාභිමානී හැඟීම් ළමා සිත් තුළ ජනිත කරවීමට උචිත ලෙස බස හැසිරවීමෙහි ලා කවියා සතු දක්ෂතාව 'ජාතික තොටිල්ල' පැදිපෙළ තුළින් මනාව ඉස්මතු වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

6. සාමාන්‍ය සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටි කතාකරුවා සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

7. 'ගංගාවේ සංගීතය' පැදිපෙළ රචනයේ දී පරිසරයේ සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදි භාෂාව භාවිත කිරීමට සමත් වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....